# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සමාගම් (සංශෝධන)

**2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තාරක බාලසූරිය මහතා විසින්
2019 මාර්තු මස 12 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 පෙබරවාරි මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[274 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# සමාගම් (සංශෝධන)

## 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ව්‍යවස්ථාව තුළ කාන්තාවන්හට තමන්ගේ විභවතාවයන් සපුරා ගැනීමට සහ තමන්ගේ ස්වීය අනන්‍ය භූමිකාවන් හා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගන්නා සාධාරණ තරග බිමක තරග කිරීම සඳහා සම අයිතිවාසිකම් ආරක්ෂා කර ඇති හෙයින් ද:

පූර්විකාව.

ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය අවම මට්ටමක පවතින අතර, විශේෂයෙන්ම සමාගම් ක්ෂේත්‍රය තුළ එය තවදුරටත් අඩුවෙමින් පවතින නිසා ආර්ථිකයට විශාල වශයෙන් ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකිවන පරිදි සමාගම් ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල තුළට කාන්තාවන් ඇතුළත් කිරීම සඳහා බලය ලබා දෙන නීති සම්පාදනය අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2019 අංක    දරන සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 201අ වගන්තිය ඇතුළත් කිරීම.

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 201 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය 201අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

> "201අ. කිසියම් සමාගමක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව තිදෙනකු හෝ ඊට වැඩි නම්, තුනෙන් එකක කාන්තා නියෝජනයක් පවත්වාගෙන යාම ප්‍රායෝගිකව හැකි අවස්ථාවක දී එම සංඛ්‍යාවෙන් තුනෙන් එකක කාන්තා නියෝජනයක් පවත්වාගෙන යා යුතු යි.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.